# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2017 අප්‍රේල් මස 04 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.38 ට සභාව රැස් විය. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.

**පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරලගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ඉසුර දේවප්‍රිය | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු ලලිත් වනිගරත්න | (බස්නාහිර පළාතේ මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු සුමිත් ලාල් මැන්දිස් | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා) |
| ගරු සුනිල් ජයමිණි | (සභා නායකතුමා) |
| ගරු ලාලන් සුදත් මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු යූ. ජෝර්ජ් පෙරේරා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අනුරාධ විමලරත්න
අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අමල් සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඈ. ශ්‍රීනාත් ම. පෙරේරා
ඉන්දික බණ්ඩාර
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
ඊ.ඒ. නන්දන පත්මකුමාර
උදාර රත්නායක
උදේන විජේරත්න
උපාලි කොඩිකාර
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එස්. කුහවරදන්
එස්.එම්. සකාවුල්ලා
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කාමල් කුරුප්පු
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කුරුසාමි කලන්කාඩි තේවර්
කේ.ඩී. අරුණ දීපාල්
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
ඩෝල්ටන් ජානක සූරියබණ්ඩාර
තුවාන් ආමිත් මොහමඩ් අක්රම්
තෙබුවන පියනන්ද හිමි
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී. අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල ප්‍රසන්න සම්පත්
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
සරත් පතිරණ
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සිරිකමල් පිලිෂියන් ද සිල්වා
සුනිල් වටගල
සුමිත් විජයමුණි ද සොයිසා
සුසිල් කිඳෙල්පිටිය
සේනක දමයන්ත ද සිල්වා
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
හරිස්චන්ද්‍ර කොස්තා
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

| | |
|---|---|
| ගරු ගුණසිරි ජයනාත් | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අර්ෂාඩ් නිසාම්ඩීන්
කොලොන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනි ගුණවර්ධන මැතිනිය
ජගත් පී. විතාන
නවසර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂන් පාදුක්ක
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
ප්‍රදීප් පෙරේරා
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මොරිස් විජේරත්න
රන්දීර් රොද්‍රිගෝ
රොයිස් විජිත
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සුසාර දිනාල්
සෙනල් වෙල්ගම

## 01. කාරක සභා වාර්තා :

ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

i. 2017.02.24 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා වාර්තාව සහ
ii. 2017.03.22 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

## 02. පළාත් සභාවේ රැස්වීම : I

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"2017.03.22 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුව, අද දින (2017.04.04 දින) විසිර යෑමෙන් අනතුරුව මෙම සභාව 2017.04.25 දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතු ය."*

## 03. පළාත් සභාවේ රැස්වීම : II

සුමිත් ලාල් මැන්දිස් ගරු සභා කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා 2017.03.22 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලද එකඟතාවයට අනුවකූලව 2017.04.18 වන දිනය හා 2017.05.09 වන දිනය යන දිනයන් සභා රැස්වීම නොපැවැත්වෙන දිනයන් විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතු ය."*

## 04. කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා :

*"කොළඹ මහ නගර සභාව විසින් 252 අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 267 වන වගන්තිය, යටතේ සාදනු ලැබූ කොළඹ මහ නගර සීමාව තුළ වාහන නැවැත්වීම තහනම් කිරීම, නවතා තැබීම සඳහා නැවතුම් ස්ථාන ඇති කිරීම සහ විධිමත් කිරීම, ගාස්තු අය කිරීම හා පැහැර හැරීම පාලනය කිරීම සඳහා විධිවිධාන සලසා ගැනීම සඳහා පනවනු ලබන කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාහන ගාල් කර තැබීමේ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථා" සම්මත කිරීම සඳහා ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් පළාත් සභාවට ඉදිරිපත් කරන ලදී.*

***එකී අතුරු ව්‍යවස්ථා වැඩිදුරටත් සලකා බැලීම සඳහා ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් එය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලදී.***

## 05. රීති අංක 107 යටතේ යෝජනාව :

අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(1), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

## 06. **පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :**

අසෝක සපුමල් රන්වල ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*"මේ මොහොත වන විට ශ්‍රී ලංකාව තුළ පවතින රජයේ වෛද්‍ය පීඨවල සිසු දරුවෝ 2017 ජනවාරි මස සිට අඛණ්ඩව පන්ති වර්ජනයක නියැලෙමින් සිටී. තවද, රටේ සියලු ප්‍රගතිශීලී බලවේග ශිෂ්‍යයන්ගේ මෙම සටනට සහයෝග දක්වමින් සිටී. මෙම සටන පෞද්ගලික වෛද්‍ය විද්‍යාල විරෝධීවූත්, නිදහස් අධ්‍යාපනයට පක්ෂපාතී වූත් ප්‍රගතිශීලී සටනකි. ඒ අනුව මෙම සටනට මූලික විෂය වී ඇති සයිටම් ආයතනය අහෝසි කර රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ශක්තිමත් කළ යුතු යැයි බස්නාහිර පළාත් සභාව රජයට යෝජනා කර සිටී."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

**අනතුරුව, ඉසුර දේවප්‍රිය - ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් එකී යෝජනාවේ තෙවන වගන්තියේ සිට එනම්, "*මෙම සටන පෞද්ගලික .... යන්න සිට .... යෝජනා කර සිටී*" දක්වා වූ කොටස් වෙනුවට,**

*"මෙම සටන නිදහස් අධ්‍යාපනයට පක්ෂපාතී වූත් ප්‍රගතිශීලී සටනක් වන නිසා පෞද්ගලික විශ්ව විද්‍යාල විධිමත් කරමින් රාජ්‍ය විශ්ව විද්‍යාල පද්ධතිය ද ශක්තිමත් කරමින් මේ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් ඇති කළ යුතු යැයි බස්නාහිර පළාත් සභාව රජයට යෝජනා කර සිටී."* යන කොටස ඉදිරිපත් කරමින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවට කරන ලද සංශෝධනයට සභාව විරෝධය පළ නොකළ හෙයින්,

සංශෝධිත යෝජනාව සභාභිමුඛ කරන ලදී.

***පූ.භා. 11.06 ට පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින්, පූ.භා. 11.30 ට යළිත් රැස් විය.***

***අ.භා. 12.10 ට, ගරු නියෝජ්‍ය සභාපති [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා]මූලාසනාරූඪ විය.***

***අ.භා. 01.59 ට, ගරු සභාපති [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 07. කල් තැබීම :

අනතුරුව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා ] විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 03.12 ට, 2017 අප්‍රේල් මස 25 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.04.05
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
කුමා/05